**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර II - 2021**

අනුරාධපුර උතුරු ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර II හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2016 නොවැම්බර් 17 දින එළඹි අංක SL-P 115 දරන ණය ගිවිසුමෙ ව්‍යාපෘති සංදේශයේ 18 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ව්‍යාපෘති සංදේශය සහ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල ජල සැපයුම් පද්ධතියක් ඉදිකිරීම තුලින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ ජල සම්පාදන ආවරණ වැඩි කිරීමත්, එමගින් ව්‍යාපෘති ප්‍රදේශයේ සෞඛ්‍ය තත්ත්වය සහ ජීවන පරිසරය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 31,598 ට සමාන ජපාන යෙන් මිලියන 27,301 ක් වූ අතර එයින් රු. මිලියන 26,779 කට සමාන ජපාන යෙන් මිලියන 23,137 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 4,819 මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ වූ ක්‍රියාකාරකම් 2017 ජුනි මාසයේදී ආරම්භ කර 2024 ජුනි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්වාගනනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 හි විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත්සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| | රු.මිලියන | | |
| මහා භාණ්ඩාගාරය විසින් සිදු කරන ලද රුපියල් මිලියන 26.42 ක සමානාත්මතා ගැලපීම් 2021 දෙසැම්බර් 31 දින දක්වා මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. | 26.42 | 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | LKAS-21 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුල සමානාත්මතා ගැලපීම සිදු කල යුතු අතර, ජනරජ ගිණුම සහ ව්‍යාපෘති ගිණුම් අතර ණය ශේෂයන් සැසඳීමට ක්‍රියා කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 12 කින් සමන්විත වන අතර එහි ක්‍රියාකාරකම් 2017 ජූනි මාසයේදී ආරම්භ කරන ලදී. එයින් ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම්, ලංසු තැබීමේ ක්‍රියාවලියට සහාය දීම සඳහා වූ උපදේශන කොන්ත්‍රාත්තුව සහ ඩබල් කැබ් රථ 02 සැපයීමේ කොන්ත්‍රාත්තුව පමණක් 2021 දෙසැම්බර් 31 දින වන විට ප්‍රදානය කොට තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී මාස 54 ක් ගතවී ඇතත් 2021 දෙසැම්බර් 31 දින වන විට ඉහත සංරචක 12න් සංරචක 10ක් ප්‍රදානය කර නොතිබුණි. එබැවින්, 2021 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ සැලකිය යුතු භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තු ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රගතිය පහත පරිදි වේ.

| | ව්‍යාපෘති සංරචකය / කොන්ත්‍රාත්තුව | 2021 දෙසැම්බර් 31 දිනට නියමිත ක්‍රියාකාරකම් (අනුමත ප්‍රසම්පාදන සැලැස්මට අනුව) | නියමිත කාල පරිච්ඡේදය | 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | ප්‍රමාදය /විගණන නිරීක්ෂණයන් |
|---|---|---|---|---|---|
| (අ) | අදියර II හි සවිස්තරාත්මක සැලසුම් සහ ලංසු තැබීමේ සහාය කටයුතු සඳහා උපදේශන සේවා සැපයීම. | සවිස්තරාත්මක සැලසුම් කිරීම ප්‍රසම්පාදන සහාය කටයුතු | 2021 නොවැම්බර් වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත | සවිස්තරාත්මක සැලසුම සම්පූර්ණ කර ඇති අතර ප්‍රසම්පාදන සහාය කටයුතු සිදුවෙමින් පවතී. | කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම ප්‍රමාදවීමට ඉඩ ඇත. |

**කළමනාකරණයේ අදහස් දැක්වීම්**

2021 වසර තුළ ශ්‍රී ලංකා රජය විසින් COVID-19 වසංගතය හේතුවෙන් පනවන ලද අගුලු දැමීමේ ඇඳිරි නීතිය, සංචරන සීමා පැනවීම්, ශ්‍රම බලකාය සීමා කිරීම වැනි සීමා බාධක හේතුවෙන්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා TECs, SCAPC, CPCC මඟින් අනුමැති ලබාගැනීමට සහ ERD හරහා JICA අවසාන අනුමැතිය ලබාගැනීමට අපේක්ෂා කලාට වඩා වැඩි කාලයක් ගතවිය. කෙසේ වෙතත්, උපදේශක සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය covid-19 සංචරන සීමා කාල සීමාවන් තුළ අඛණ්ඩව වැඩ කිරීමෙන් JICA ඇතුළු ඉහත අධිකාරීන්ගෙන් ලංසු ලේඛන සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා ලදී. අඛණ්ඩව වැඩ කිරීම නිසා, 2021 වර්ෂය තුළ ප්‍රධාන පැකේජ 6 න් 5 කම ලංසු කැඳවීමට හැකිවිය.

තවද, කොන්ත්‍රාත්තුවේ සවිස්තරාත්මක සැලසුම් අදියර 2020 අගෝස්තු 31 දින වන විට අවසන් කරන ලද අතර එම නිසා නිර්මාණ කටයුතුවලට අදාළ සියලුම විදේශීය සහ දේශීය වෘත්තිකයන්ගේ යෙදවීම් නතර කරන ලදී. උපදේශන කොන්ත්‍රාත්තුව 2020 සැප්තැම්බර් මාසයේ සිට ප්‍රසම්පාදන සහාය අදියරේ පවතී

| | |
|---|---|
| **විගණකගේ නිර්දේශයන්** | කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම තවදුරටත් ප්‍රමාද නොකර කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | තුළම්මුව පරිශ්‍රය, ජල පිරිපහදු ඒකකය, ජල ගබඩා ව්‍යුහයන්, යාන්ත්‍රික, විදුලි සහ ගොඩනැගිලි කටයුතු ඉදිකිරීම - ( A - කොටස) | කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම | 2021 නොවැම්බර් සිට 2024 මැයි දක්වා | අයදුම්කරුවන්ගේ පූර්ව සුදුසුකම් සඳහා JICA එකඟතාව ලැබී ඇත. කෙසේ වෙතත්, 2022 මැයි 31 වන දින දක්වා කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වීමේ හැකියාව. |

| | |
|---|---|
| **කළමනාකරණයේ අදහස් දැක්වීම්** | පූර්ව සුදුසුකම් ප්‍රතිඵල සඳහා JICA එකඟතාවය 2021.10.24 දින ලැබිණි. A කොටස සඳහා වූ ලංසු ලේඛනයේ පළමු කෙටුම්පත 2021.01.21 දින සකස් කරන ලදී. කෙසේ වෙතත්, COVID-19 කාලය තුළ සංචරන සීමා කිරීම් සහ සීමිත ශ්‍රම බලකාය වැනි සීමා සහිත සේවා පරිසරය හේතුවෙන්, TEC වෙතින් නිර්දේශ ලබා ගැනීම සහ SCAPC වෙතින් අනුමැතිය ලබා ගැනීම සහ ඒ අනුව ලේඛනය සංශෝධනය කිරීම ප්‍රමාද වූයේ එය අනෙක් ඒවාට සාපේක්ෂව විශාලතම ව්‍යාපෘති සංරචකය වන අතරම, එය තුළම්මුව, ජල පරිපහදු ඒකකය, අනෙකුත් සියලුම ජල රඳවන ව්‍යුහයන් සහ ගොඩනැගිලි සහ එහි යාන්ත්‍රික හා විදුලි කටයුතු වලින් සමන්විත වන බැවිනි. ලංසු ලේඛනය 2021.09.10 දින JICA වෙත ඉදිරිපත් කරන ලද අතර 2021.10.11 දින JICA හි අදහස් ලබා ගන්නා ලදී. JICA හි අදහස් දැක්වීම්වලට සහභාගී වීමෙන් පසු ලේඛනය නැවතත් TEC හි සමාලෝචනය සඳහා යවන ලද අතර පසුව SCAPC මගින් අවසානයේ 2022.03.03 දින ඔවුන්ගේ නිර්දේශ සමඟ JICA හි එකඟතාව ලබා ගන්නා ලදී.<br><br>JICA හි නිර්දේශය අනුව ලේඛනය සංශෝධනය කිරීමෙන් පසුව, 2022.04.20 දින ලංසු කැඳවන ලදී. එය මුලින් 2022.06.29 දින වසා දැමීමට අපේක්ෂා කල නමුත් රටේ පවතින ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් ජල සම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් සහ ලංසුකරුවන්ගේ ඉල්ලීම් හේතුවෙන් ලංසු වසා දැමීමේ දිනය 2022.09.21 දක්වා දීර්ඝ කෙරුණි. |
| **විගණකගේ නිර්දේශයන්** | කොන්ත්‍රාත් ප්‍රදානය කඩිනම් කර සිවිල් වැඩ ප්‍රමාදයකින් තොරව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | DI, HDPE සම්ප්‍රේෂණ ජාලයන් සහ HDPE බෙදාහැරීමේ ජාලයන් සැපයීම සහ ඇතිරීම ( B කොටස) | කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම | 2021 නොවැම්බර් සිට 2024 අප්‍රේල් දක්වා | තාක්ෂණික ඇගයීම් කටයුතු TEC මඟින් සිදු කර ඇත. කෙසේ වෙතත්, 2022 මැයි 31 දක්වා කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නොතිබුණි. | කොන්ත්‍රාත්තු ප්‍රදානය ප්‍රමාද වීමේ හැකියාව |

| | |
|---|---|
| **කළමනාකරණයේ අදහස් දැක්වීම්** | සංචරන සීමා කිරීම් සහ සීමිත ශ්‍රම බලකාය වැනි සීමා සහිත සේවා තත්වයන් හේතුවෙන් තාක්ෂණික ලංසු ඇගයීම් සිදු කිරීම ප්‍රමාද විය. SCAPC අනුමැතිය ලබා ගැනීමෙන් පසු තාක්ෂණික ලංසු ඇගයීම් වාර්තාව 2022.03.03 දින JICA වෙත යවන ලදී. JICA ආයතනය සිය නිරීක්ෂණ සිදු කර පැහැදිලි කිරීම් ඉල්ලා සිටි අතර ඒ සඳහා ලංසුකරුවන්ගෙන් වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය විය. ඒ අනුව |

ලංසුකරුවන්ගෙන් පැහැදිලි කිරීම් ඉල්ලා සිටි අතර රටේ වත්මන් ගැටළුකාරී තත්ත්වය පෙන්වා දෙමින් ලංසුකරුවන් තවත් කල් ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, පැහැදිලි කිරීමේ තක්සේරු වාර්තාව සකස් කර ඇති අතර ඒ සඳහා SCAPC වෙතින් අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී.

**විගණකගේ නිර්දේශයන්** කොන්ත්‍රාත් ප්‍රදානය කඩිනම් කිරීමටත් කොන්ත්‍රාත්තුව ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | පදවිය සහ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා HDPE, DI බෙදාහැරීමේ ජාලයන් සැපයීම සහ ඇතිරීම සහ සේවා සම්බන්ධතා සැපයීම (C1 කොටස) | කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම | 2021 අගෝස්තු සිට 2023 නොවැම්බර් දක්වා | 2021 ඔක්තෝම්බර් 13 වන දින ලංසු කැඳවීම අවසන් කරන ලද අතර TEC මඟින් ඇගයීම සිදු කෙරෙමින් පවතී. කෙසේ වෙතත්, 2022 මැයි 31 වන දින දක්වා කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය ප්‍රමාද වීමේ හැකියාව. |

**කළමනාකරණයේ අදහස් දැක්වීම්** 2021 වසර තුළ ශ්‍රී ලංකා රජය විසින් COVID-19 වසංගතය හේතුවෙන් පනවන ලද අගුලු දැමීමේ ඇඳිරි නීතිය, සංචරන සීමා පැණවීම්, ශ්‍රම බලකාය සීමා කිරීම වැනි සීමා කිරීම් හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය covid-19 සංචරන සීමා කාල සීමාවන් තුළ අඛණ්ඩව වැඩ කිරීමෙන් JICA ඇතුළු ඉහත අධිකාරීන්ගෙන් ලංසු ලේඛන සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා ලදී. එලෙස අඛණ්ඩව වැඩකොට C1 කොටස සඳහා 2021.07.21 දින ලංසු කැඳවා එය 2021.10.21 දින අවසන් කර, 2022.04.08 දින ලංසු ඇගයීම සඳහා JICA එකඟතාව ලබා ගත් අතර, ව්‍යාපෘති කලමනාකරණය ඒකකය සහ ජලසම්පාදන අමාත්‍යාංශය විසින් ඒකාබද්ධව සකස් කරන ලද අවසන් කැබිනට් පත්‍රිකාව ජල සම්පාදන අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා ගැනීම සඳහා 2022 අප්‍රේල් 3 වන සතියේ සිට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. C1 පැකේජය 2022 මැයි මස 2 වන සතිය තුළ ප්‍රදානය කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, පවතින දේශපාලන අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් කැබිනට් අනුමැතිය ලබා ගැනීම සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වෙමින් පවතී.

**විගණකගේ නිර්දේශයන්** කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ කටයුතු කඩිනමින් නිමකර නල ඇතිරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඉ) | කහටගස්දිගිලිය, හොරොව්පොතාන සහ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (C2 කොටස) සඳහා HDPE සැපයීම සහ ඇතිරීම, බෙදාහැරීම් ජාලයන් සහ සේවා සම්බන්ධතා සැපයීම. | කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම | 2021 ඔක්තෝබර් සිට 2021 දෙසැම්බර් දක්වා | ලංසු කැඳවීම 2021 ඔක්තෝම්බර් 21 වන දින අවසන් කරන ලදී. TEC විසින් ඇගයීම් කටයුතු සිදු කෙරෙමින් පවතී කෙසේ වෙතත්, 2022 මැයි 31 වන දින දක්වා | කොන්ත්‍රාත්තුව ප්‍රදානය ප්‍රමාද වීමේ හැකියාව |

| | | | | |
|---|---|---|---|---|
| | | | කොන්ත්‍රාත්තු වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි. | |

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

2021 වසර තුළ ශ්‍රී ලංකා රජය විසින් COVID-19 වසංගතය හේතුවෙන් පනවන ලද අගුලු දැමීමේ ඇඳිරි නීතිය, සංචරන සීමා පැණවීම්, ශ්‍රම බලකාය සීමා කිරීම වැනි සීමා කිරීම් හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද විය.
කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය covid-19 සංචරන සීමා කාල සීමාවන් තුළ අඛණ්ඩව වැඩ කිරීමෙන් JICA ඇතුළු ඉහත අධිකාරීන්ගෙන් ලංසු ලේඛන සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා ලදී. එලෙස අඛණ්ඩව වැඩකොට C2 කොටස සඳහා 2021.07.28 දින ලංසු කැඳවන ලදී. එය 2021 ඔක්තෝම්බර් 21 වන දින අවසන් කරන ලදී. 2022.04.08 වැනි දින ලංසු ඇගයීම සඳහා JICA එකඟතාව ලබා ගත් ව්‍යාපෘති කලමනාකරණය ඒකකය සහ ජලසම්පාදන අමාත්‍යංශය විසින් ඒකාබද්ධව සකස් කරන ලද අවසන් කැබිනට් පත්‍රිකාව ජල සම්පාදන අමාත්‍යංශය විසින් අනුමැතිය ලබා ගැනීම සඳහා 2022 අප්‍රේල් 3 වන සතියේ සිට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. C1 පැකේජය 2022 මැයි මස 2 වන සතිය තුළ ප්‍රදානය කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, පවතින දේශපාලන අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් කැබිනට් අනුමැතිය ලබා ගැනීම සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වෙමින් පවතී.

**විගණකගේ නිර්දේශයන්**

කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ කටයුතු කඩිනමින් නිමකර ඇතිරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| **(ඊ)** | HDPE සැපයීම සහ ඇතිරීම, සේවා සම්බන්ධතා සැපයීමේ බෙදාහැරීමේ නල මාර්ග සහ ඝන මීටර 250 ධාරිතාවයේ ජල කුළුණ ඉදිකිරීම (C3 කොටස - අදියර I සඳහා) | අදියර -01 හි කොටසක් හේතුවෙන් අනුමත වැඩ - සැලැස්මෙහි ඇතුලත් කර නොමැත | 2021 නොවැම්බර් 17 වන දින ලංසු කැඳවූ අතර 2022 ජනවාරි 12 දින අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වීමේ හැකියාව. |

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර II හි සවිස්තරාත්මක සැලසුම් සහ ලංසු කටයුතු සඳහා සහාය වීමේ කොන්ත්‍රාත්තුව යටතේ C3 පැකේජය සඳහා ලංසු ලේඛනය සකස් කිරීම සඳහා JICA එකඟතාව 2020.10.11 දින ඉල්ලා ඇති අතර JICA එකඟතාව 2021.02.02 දින ලබා ගන්නා ලදී. තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කරනු ලැබුවේ 2022 මාර්තු 16 දින දීය. 2021 වසර තුළ ශ්‍රී ලංකා රජය විසින් COVID-19 වසංගතය හේතුවෙන් පනවන ලද ඇඳිරි නීතිය, සංචරන සීමා, ශ්‍රම බලකාය සීමා කිරීම වැනි සීමාවන් පනවා තිබුණද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය covid-19 සංචරන සීමා කාල සීමාවන් තුළ අඛණ්ඩව වැඩ කිරීමෙන් TEC, SCAPC සහ JICA වෙතින් ලංසු ලේඛන සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව ලංසු කැඳවීම් 2022.11.17 දින ආරම්භ කල අතර 2022.01.26 දින එය අවසන් කරන ලදී. ලංසුව 2022.01.27 සිට TEC විසින් ඇගයීමට ලක් කෙරේ.

**විගණකගේ නිර්දේශයන්**

කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ කටයුතු කඩිනමින් නිමකර ඇතිරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| (උ) | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශන සේවාව (F කොටස) | කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම | 2021 අගෝස්තු සිට 2024 මැයි දක්වා | RFP 2021 ජූලි 14 නිකුත් කරන ලදී එය 2021 සැප්තැම්බර් 22 දින වසා දමන ලදී. තාක්ෂණික ඇගයීම JICA එකඟතාව වෙත යොමු කරන ලදී. | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා ප්‍රසම්පාදන උපදේශන සේවාව ලබා ගැනීම ප්‍රමාද වීමේ හැකියාව. |

**කළමනාකරණයේ අදහස් දැක්වීම** සාර්ථක උපදේශකයෙකු සමඟ ගිවිසුම් සාකච්ඡා සිදු කළ යුතුය. වත්මන් දේශපාලන සහ සමාජ අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් MWS/CPCC විසින් සාකච්ඡා දිනය ලබා දී නොමැත.

**විගණකගේ නිර්දේශයන්** කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම කඩිනමින් නිම කිරීමටත් කොන්ත්‍රාත්තුව ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය සඳහා උපදේශන කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 26 දින ප්‍රදානය කර තිබුණේ ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන සහාය කටයුතු සඳහා පමණක් වන අතර එය 2020 පෙබරවාරි 20 වන විට මාස 22ක් ඇතුළත නිම කිරීමට නියමිතව තිබුණි. පසුව, සවිස්තරාත්මක සැලසුම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් එය 2022 ජූලි 31 දක්වා දීර්ඝ කර ඇත. ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන සහය සඳහා වූ උපදේශන කොන්ත්‍රාත්තුවේ කාලසීමාව 2022 ජූලි 31 දිනෙන් අවසන් වුවද, ව්‍යාපෘති කොන්ත්‍රාත්තු 12න් 10ක් 2022 ජූලි 31 දින දක්වා ප්‍රදානය කර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියට TECs, SCAPC, CPCC මඟින් අනුමැති ලබාගැනීම සහ ERD හරහා JICA එකඟතාව, කැබිනට් අනුමැතිය ලබා ගැනීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අවසාන JICA එකඟතාව සඳහා Covid-19 වසංගතය හේතුවෙන් 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා රජය විසින් පනවන ලද ඇඳිරි නීතිය, සංචරන සීමා, ශ්‍රම බලකාය සීමා කිරීම් වැනි සාධක හේතුවෙන් බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ගතවුණි. කෙසේ වෙතත්, උපදේශක සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය covid-19 සංචරන සීමා කාල සීමාවන් තුළ අඛණ්ඩව වැඩ කිරීමෙන් JICA ඇතුළු ඉහත අධිකාරීන්ගෙන් ලංසු ලේඛන සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා ලදී. එලෙස අඛණ්ඩ උත්සාහය නිසා ලංසු 06 න් 03 ක් ප්‍රදානය කිරීමේ අදියරේත්, ලංසු දෙකක් ඇගයීමේ අදියරේත්, එක් ලංසුවක් ලංසු තැබීමේ අදියරේත් පැවතුණි. | වැඩ කඩිනම් කිරීමට පියවර ගත යුතුයි. |
| (ආ) | මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරය සහ සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා උපදේශන කොන්ත්‍රාත්තුව යටතේ රුපියල් මිලියන 4ක් වෙන් කර තිබුණි. ව්‍යාපෘතියේ උපදේශන කොන්ත්‍රාත්තුව 2022 ජූලි 31 දිනෙන් අවසන් වී තිබුණද, 2021 දෙසැම්බර් 31 දින දක්වා එවැනි මහජනතාව දැනුවත් කිරීමේ | 2021 වර්ෂය තුළ Covid – 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා රජය විසින් පනවන ලද ඇඳිරි නීති කාලසීමාව, සංචරන සීමා, ශ්‍රම බලකාය සීමා කිරීම, රැස්වීම් පැවැත්වීමට ජනතාව රැස් කිරීමෙන් වැළකීම යනාදී නොයෙකුත් සීමා බාධක හේතුවෙන්, මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරය සහ ප්‍රජාවන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීමට 2021 වර්ෂය තුළ නොහැකි විය. කෙසේ වෙතත්, PMU විසින් 2022 ජනවාරි මාසයේ දී මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් | ව්‍යාපෘති ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ජනතාව දැනුවත් කිරීම කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| වැඩමුළුවක් හෝ ප්‍රජාවන් සඳහා සම්මන්ත්‍රණ ව්‍යාපෘතිය මගින් පවත්වා නොතිබුණි. | ආරම්භ කර 2022 අප්‍රේල් වන විට ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන්, දේශපාලන අධිකාරීන්, CBOs, ගොවි සංවිධාන, ප්‍රජා නායකයින් සහ ඉදිකිරීම් ස්ථාන අවට ජනතාව යනාදී පාර්ශවයන් සඳහා මෙය පවත්වා අවසන් කර ඇත. | |

### 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ විශේෂ යෙන් ගිණුමේ මාසික බැංකු ප්‍රකාශය විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ගණුදෙණුවල විනිමය ලාභය ලෙස කෙරෙමින් පවතින වැඩ යටතේ පෙන්වා ඇති රුපියල් මිලියන 7.75 ක් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | මහ බැංකුව විසින් NWSDB වෙත බැංකු ප්‍රකාශන ඉදිරිපත් කර නැත. PMU විසින් ගිණුම්කරණ සහ වාර්තා කිරීමේ අරමුණ සඳහා වියපැහැදම් වාර්තා (CS-DRMS 814 වාර්තාව) හරහා විස්තර ගනු ලැබේ. ඒ අනුව PMU විසින් මහ බැංකුවෙන් බැංකු ප්‍රකාශය ඉල්ලා සිටිනු ඇත. | මාසික බැංකු ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය මගින් රු.මිලියන 19.59 පිරිවැයක් දරමින් කැබ් රථ දෙකක් මිලදී ගෙන ඇත. කෙසේ වෙතත් ඉන් එක් ඩබල් කැබ් රථයක් ප්‍රධාන කාර්යාලයට පවරාගෙන තිබුණි. දැනට ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ සමාජ විද්‍යාඥයන් ඇතුළු ඉංජිනේරුවන් පස් දෙනෙකු ව්‍යාපෘති කටයුතුවල නිරතව සිටිති. ඊට අමතරව, ඉදිකිරීම් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, නල එළීමේ කටයුතු සඳහා මාර්ග අනුමත කිරීම් ආදිය මැනීම, අධීක්ෂණය සහ අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීම සහ අදාළ අත්පත් කර ගැනීම සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම යනාදී කටයුතු ව්‍යාපෘතියේ ඉදිකිරීම් කඩිනම් කිරීම සඳහා සිදු කළ යුතු වේ. එසේ වුවද, ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන පහසුකම් යටතේ එක් ඩබල් කැබ් රථයක් පමණක් වෙන් කර ඇති බව නිරීක්ෂණය වූ අතර, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාද 2021 ඔක්තෝබර් 06 වැනි දින මෙම ගැටලුව පෙන්වා දී ඇතත්, ප්‍රධාන කාර්යාලය මගින් ව්‍යාපෘතියට ප්‍රමාණවත් ප්‍රවාහන | ව්‍යාපෘතිය සඳහා ඩබල් කැබ් රථ දෙකක් මිලදීගෙන තිබුණි. නමුත් ඒ වන විට සැලසුම් අදියර යටතේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කොළඹ පිහිටා තිබූ නිසා එක් කැබ් රථයක් පමණක් අවශ්‍ය විය. මේ හේතුව නිසා අවශ්‍ය විටෙක PMU ඉල්ලීම මත වාහනය මුදා හැරීමේ එකඟතාවය ඇතිව PK 3420 දරන කැබ්රථය WSP විසින් තාවකාලිකව අත්පත් කරගන්නා ලදී. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා 2021 ඔක්තෝම්බර් 06 වන දින වාහනය ව්‍යාපෘතිය වෙත මුදාහරින ලෙස ප්‍රධාන කාර්යාලයෙන් ඉල්ලා සිටි අතර, එහිදී ඔවුන්ගේ සියලුම ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සඳහා මෙම රථය අවශ්‍ය බව WSP දන්වා සිටියේය. එබැවින් NWSDB හි සාමාන්‍යාධිකාරී වාහනයක් කුලී පදනම මත ගැනීමට අනුමත කර ඇත. ඒ අනුව 2022.01.01 දින වාහනයක් කුලියට ගත් අතර එය මහජනතාව දැනුවත් කිරීමේ වැඩමුළුව සඳහාද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට අනුමැතීන් ලබාගැනීම සඳහා අදාළ බලධාරීන්ගේ කාර්යාල වෙත යැමට සහ අදාළ අත්පත් කර ගැනීම් සඳහා මහජනතාව සමඟ සම්බන්ධීකරණය කිරීම වැනි කටයුතු සඳහාද යොදා ගැණුනි. කෙසේ වෙතත්, කුලියට ගත් වාහනය සඳහා ගෙවීමට මුදල් නොමැතිකම | ව්‍යාපෘති කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ව්‍යාපෘති පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පහසුකම් සැපයීමට හෝ 2022 ජූනි 30 දක්වා ප්‍රධාන කාර්යාලය විසින් අත්පත් කරගත් ඩබල් කැබ් රථය මුදා හැරීමට හෝ කටයුතු ගෙන නොතිබුණි. | හේතුවෙන් 2022 ජූනි 07 දින එය නතර කරන ලදී. | |
| (ඇ) | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර II යටතේ කැබිතිගොල්ලෑව, පදවිය, හොරොව්පතාන, කහටගස්දිගිලිය යන ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශ ආවරණය කරයි. අනෙකුත් දිස්ත්‍රික්ක හා සසඳන විට මෙම ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව අධික කඨිනත්වයකින් යුතු අනාරක්ෂිත භූගත ජලයෙන් යැපෙන බැවින් දන්තමය හා අස්ථි ෆ්ලෝරෝසිස් මෙන්ම නිදන්ගත වකුගඩු රෝගීන්ගේද සීඝ්‍ර ව්‍යාපෘතියන්ද මෙම ප්‍රදේශ තුල වාර්තා වී ඇත. එබැවින් සුරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා මෙම ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රමුඛත්වය දී ඇත. ජනතාවට ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභ සැලසීම සඳහා මෙම ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති නියමිත කාල සීමාව තුළ අවසන් කළ යුතු බව විගණනය නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, එහි ප්‍රසම්පාදන සැලැස්මට අනුව ක්‍රියාත්මක කොට නොතිබූ අතර එහි ක්‍රියාකාරකම් ආරම්භ වී මාස 54 ක් ගතවී ඇතත් ව්‍යාපෘතියේ කිසිදු සිවිල් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ක් ප්‍රදානය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සංශෝධිත ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීම සැක සහිත බව නිරීක්ෂණය විය. | TECs, SCAPC, CPCC සහ JICA අනුමැතියෙන් ERD හරහා අනුමැතිය ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, කැබිනට් අනුමැතිය ලබා ගැනීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අවසාන JICA එකඟතාව සඳහා Covid-19, අගුලු දැමීමේ ඇඳිරි නීතිය, සංචාර වැනි සීමා කිරීම් හේතුවෙන් බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ගතවේ. 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා රජය විසින් පනවන ලද සීමා කිරීම්, ශ්‍රම බලකාය සීමා කිරීම සහ රටේ දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය.<br><br>කෙසේ වෙතත්, උපදේශක සහ PMU-ANWSP II අදියර ව්‍යාපෘතිය, covid-19, සංචාරක සීමා කාල සීමාවන් තුළ අඛණ්ඩව වැඩ කිරීමෙන් JICA ඇතුළු ඉහත බලධාරීන්ගෙන් ලංසු ලේඛන සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා ලදී. අඛණ්ඩ උත්සාහය නිසා ලංසු හයෙන් තුනක් ප්‍රදානය කිරීමේ අදියරේත්, ලංසු දෙකක් ඇගයීමේ අදියරේත්, එක් ලංසුවක් ලංසු තැබීමේ අදියරේත් පැවතුණි. | ව්‍යාපෘතියෙන් රජයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංශෝධිත ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

**3.4 පද්ධති සහ පාලනයන්**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | 2021 වසර සඳහා රු.මිලියන 1,338 ක මුදලක් වෙන් කර තිබුණද, ඉන් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදනවලින් සියයට 0.22 ට සමාන මිලියන 3 ක් පමණක් භාවිතා කර ඇත. | 2020 මැද භාගයේදී 2021 අයවැය සකස් කිරීමේදී, පහත වගුවේ සඳහන් පරිදි 2021 3 වන කාර්තුවේ සිට අත්තිකාරම් ගෙවීම් සහ ප්‍රගති ගෙවීම් කිරීමට සැලසුම් කර තිබූ නමුත් රටේ පවතින වත්මන් මූල්‍ය හා ආර්ථික තත්ත්වය සහ විශේෂයෙන්ම 2022 අප්‍රේල් මාසයේ සිට JICA අනුමැතිය ලබාගැනීම, කැබිනට් අනුමැතිය ලබාගැනීම ප්‍රමාද වීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. | වැඩ සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දින චක්‍රලේඛ අංක 05 මගින් නියම කර ඇති පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් වී නොතිබුණි. | ආරම්භයේ සිට මේ දක්වා අනුරාධපුර උතුර ජලසම්පාදන ව්‍යාපෘතියේ අදියර II සඳහා කිසිදු අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැත. | අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුයි. |